# 9.2 ආරක්ෂණවාදය

දේශීය වෙළඳපොළට විදේශීය භාණ්ඩ ඇතුලුවීම සීමා කරන හෝ වළක්වන ඕනෑම ක්‍රියා පිළිවෙතක් ආරක්ෂණවාදය ලෙස හැදින්වේ.

මේ සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග ආරක්ෂණවාදී ප්‍රතිපත්ති නම් වේ.

ආරක්ෂණවාදී ප්‍රතිපත්ති මගින් නිදහස් වෙළඳපොළට බාධා පමුණුවයි.

ආරක්ෂණවාදී ප්‍රතිපත්ති කොටස් දෙකකි,

- තීරුබදු සම්බාධක (අපනයන තීරුබදු, ආනයන තීරුබදු) * ශ්‍රීලංකාවේ ආනයන තීරුබදු පමණක් ක්‍රියාත්මක වේ.
- තීරුබදු නොවන සම්බාධක (ආනයන සලාක ක්‍රම, ප්‍රපතනය, විදේශ විනිමය පාලනය, වෙළඳ සම්බාධක, ආනයන තහනම් කිරීම ආදී ....)

**නාමික ආරක්ෂණය හා සඵල ආරක්ෂණය**

ආනයන තීරු බද්දක් හේතුවෙන් දේශීයව නිපදවනු ලබන තරගකාරි භාන්ඩයකට ආනයනය කරනු ලබන භාණ්ඩයේ මිල ඉහළ යාමේ ප්‍රතිශතය තුළින් ලැබෙන ආරක්ෂණය නාමික ආරක්ෂණ අනුපාතය නම් වේ. මෙමගින් දේශීය භාණ්ඩය වෙත ලැබෙන සැබෑ ආරක්ෂණය පිළිබිඹු නොවේ.

ආනයන තීරුබද්දකින් පසුව දේශීය තරගකාරි නිෂ්පාදනයක එකතුකළ අගයත් තීරුබදු පැනවීමට පෙර දේශීය නිෂ්පාදනයට එකතුකළ අගයත් අතර වෙනස තීරුබදු පැනවීමට පෙර දේශීය නිෂ්පාදනයට එකතුකළ අගයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම සඵල ආරක්ෂණ අනුපාතිකයයි.

$$\text{සඵල ආරක්ෂණ අනුපාතිකය} = \frac{\text{තීරුබද්දෙන් පසු දේශීය නිමැවුමේ එකතුකළ අගය} - \text{නිර්බාධ වෙළඳාම යටතේ දේශීය නිමැවුමේ එකතුකළ අගය}}{\text{නිර්බාධ වෙළඳාම යටතේ දේශීය නිමැවුමේ එකතු කළ අගය}} \times 100$$

$$ERP = \frac{V_1 - V_0}{V_0} \times 100$$

**<u>අභ්‍යාසය</u>**

1) අර්තාපල් නිෂ්පාදනයට සම්බන්ධව පහත විස්තර ඔබට සපයා ඇත,

**අර්තාපල් කිලෝවක ආනයන මිල රු 80.00**

**අර්තාපල් කිලෝවක් නිපදවීමට අවශ්‍ය ආනයන යෙදවුම් මිල රු** 50.00

**අර්තාපල් කිලෝවක දේශීය මිල රු 80.00**

**ආනයන තීරුබද්ද 20%**

i. අබාධ වෙළඳාම යටතේ අර්තාපල් කිලෝවක එකතුකළ අගය ගණනය කරන්න.
ii. අර්තාපල් ආනයනට 25% තීරුබද්දක් පනවන ලදි නම් අර්තාපල් කිලෝවක එකතුකළ අගය ගණනය කරන්න.
iii. සඵල ආරක්ෂණ අනුපාතය ගණනය කර ඒ පිළිබඳව විමසීමක් කරන්න.
iv. ආනතික අමුද්‍රව්‍ය මතද 20 % තීරුබද්දක් අයකරයි නම් එම භාණ්ඩයේ එකතුකළ අගයත් සඵල ආරක්ෂණ අනුපාතයත් ගණනය කර ඒ පිළිබඳව ද අදහස් දක්වන්න.

2) නිදහස් වෙළඳාමට රටවල් බාධා පමුණුවන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.